## ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය - 2015

------------------------------------------

ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107 (5) උප වගන්තිය සහ 108 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108 (1) උප වගන්තිය ප්‍රකාර විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම.

------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාල වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරුකිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 111 වන වගන්තියෙන් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට වයඹ විශ්වවිද්‍යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 01**

වත්කම් හා වගකීම් ඉඩදෙන අවස්ථාවලදී හැර හිලව් කළ නොහැකි වුවද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.201,145 ක්වූ ගෙවිය යුතු ශිෂ්‍යත්ව මුදලින් ශිෂ්‍යයින්ට වැඩිපුර ගෙවන ලද රු.44,427 ක් අඩුකර මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා තිබුණි.

**(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 03**

ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු. 451,864,242 ක්වූ වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

**(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 07**

වත්කමක් ප්‍රයෝජනවත් තත්ත්වයකට පත්කල අවස්ථාවේ සිට එහි ප්‍රයෝජනවත් ජීවිත කාලය පුරා ක්‍රමානුකූල පදනමකින් ක්ෂය කළයුතු නමුත් 2006 හා 2008 වර්ෂවලදී ලබාගෙන තිබූ රු.307,045 ක් වටිනා පුස්තකාල පොත් සමාලෝචිත වර්ෂයේදී ප්‍රාග්ධනිත කිරීම නිසා ඉකුත් වර්ෂයට අදාල ක්ෂය සඳහා ගැලපීම් කර නොතිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

සමාලෝචිත වර්ෂය අවසානයට රාජ්‍ය ප්‍රාග්ධන ප්‍රදාන එකතුව රු.2,918,722,000 ක් වූ අතර එම ප්‍රදාන උපයෝගීකර ගනිමින් අත්පත් කරගත් වත්කම් ක්ෂයකර තිබූ නමුත් ඒ වෙනුවෙන් වූ ක්‍රමක්ෂය ගිණුම් තැබීමට කටයුතු කර නොතිබුණි.

#### 2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කුලියාපිටිය භෞතික අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ගබඩා කාමරයක් සෑදීමේදී අත රඳවාගෙන තිබූ රු.73,843 ක මුදල 2013 දෙසැම්බර් 15 වන දින පියවීමේදී අතරුදවුම් ගිණුම හර කිරීම වෙනුවට ගොඩනැගිලි ගිණුම හර කර තිබුණි

(ආ) 2003 පෙබරවාරි සිට 2015 සැප්තැම්බර් දක්වා එකතුව රු.1,197,000 ක්වූ බැංකුවට සෘජු ලැබීම් හඳුනා ගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

**2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම.**

වටිනාකම රු.1,836,129,051 ක් වූ ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් උපලේඛන, ස්ථාවර වත්කම් ලේඛනය හා භෞතික සමීක්ෂණ වාර්තා විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

**2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| **නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව** | **අනුකූල නොවීම** |
|---|---|
| (අ) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 45 වන වගන්තිය හා 2005 ජූලි 15 දිනැති අංක 30 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | භාණ්ඩාගාරයේ හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව එකතුව රු.29,400,000 ක් සමාලෝචිත වර්ෂය තුළදී ආයෝජනය කර තිබුණි. |
| (ආ) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 99 (1) උපවගන්තිය | උසස් අධ්‍යාපන ආයතනයට අයත් වූ කවර ප්‍රභවයකින් හෝ ලැබෙන මුදල් විශ්වවිද්‍යාල අරමුදලට බැර කර විශ්වවිද්‍යාල මූල්‍ය අවශ්‍යතා සඳහා යොදාගත හැකි වුවත්, එයට පටහැනිව පීඨ මගින් පවත්වාගෙන යන ස්වයං පාඨමාලාවට අදාළ ගිණුම් 22 ක 2015 දෙසැම්බර් 31 දිනට එකතුව රු.82,315,865 ක් වෙනත් බැරකම් යටතේ දක්වා තිබුණි. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය IX වැනි පරිච්ඡේදයේ 2.2 ඡේදය | රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන් විසින් කාර්යාල වේලාවන් තුළදීම කාර්යාලීය නොවන වැඩ ඉටු කිරීම වෙනුවෙන් ලැබෙන ගාස්තුවෙන් සියයට 10 ක ප්‍රමාණයක් ඒකාබද්ධ අරමුදලට බැරකල යුතු වුවත්, ස්ථිර අධ්‍යයන කාර්ය මණ්ඩලයට අයත් කථිකාචාර්යවරුන් එම විශ්වවිද්‍යාලයේම වෙනත් පීඨවල බාහිර කථිකාචාර්යවරුන් ලෙස සේවය කිරීමෙන් උපයන ආදායමින් ඉහත ප්‍රකාර ගෙවීම් කර නොතිබුණි. |

(ඈ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
මුදල් රෙගුලාසි සංග්‍රහය
මුදල් රෙගුලාසි 770 හා772

2015 දෙසැම්බර් 31 දිනට ගබඩාවල වූ රු.810,384 ක් වටිනා භාණ්ඩ අයිතම 120 ක් භාවිතයට ගත නොහැකි තොග ලෙසත් රු.1,529,503 ක් වටිනා භාණ්ඩ 51 ක් පරිහරණයට නොගන්නා භාණ්ඩ ලෙසත් හඳුනා ගෙන තිබූ අතර, එම භාණ්ඩ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**2.4 ලැබියයුතු හා ගෙවියයුතු ගිණුම්**

----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විවිධ ණයගැති වටිනාකම රු.17,932 ක් හා ලැබිය යුතු නේවාසිකාගාර ගාස්තු වටිනාකම රු.261,867 ක් වසර 05 කට වැඩි කාලයක සිට හිඟව පැවතුණි.

(ආ) වසර 02 සිට වසර 04 දක්වා කාලයක් තුලවූ ණයහිමි, රඳවාගැනීම් හා තැන්පතු එකතුව වූ රු.29,097,110 ක ශේෂය හා වෙනත් වගකීම් යටතේ පෙන්වා තිබුණු රු.691,987 ක වගකීම් විෂයයන් 06 ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2013 වර්ෂයේ වැඩ නිම කර භාරදුන් මාකඳුර කෘෂි හා වැවිලි කළමනාකරණ පීඨයේ දෙවන අදියර හා කුලියාපිටිය ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨයේ I අදියර සඳහා පිළිවෙලින් රු.7,575,176 ක් හා රු.3,638,359 ක් සඳහා ගෙවිය යුතු මුදල් 2015 දෙසැම්බර් 31 දින වන විටත් නිරවුල් කර නොතිබුණි.

(ඈ) බාහිර පාර්ශවයන් වෙත ගෙවූ වසර 17 ක් පැරණි රු.386,045 ක අත්තිකාරම් මුදල් පියවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) 2015 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම්වල දැක්වෙන වසර 01 ට වැඩි, වසර 02 ට හා වසර 03 ට වැඩි වටිනාකම් පිළිවෙලින් රු.409,698 ක්, රු.697,516 ක් හා රු.935,641 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

----------------------

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රතිඵලය රු.140,081,000 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.101,915,000 ක් වීමෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ඌනතාවයෙහි රු.38,166,000 ක වැඩිවීමක් නිරීක්ෂණය විය. පුනරාවර්තන වියදම් සඳහා රාජ්‍ය ප්‍රදාන රු.145,242,000 කින් වැඩිවී තිබුණද, සේවක පාරිශ්‍රමික හා ක්ෂය පිළිවෙලින් රු.115,979,000 කින් හා රු.55,042,000 කින් වැඩිවීම ඌනතාවය වැඩිවීම කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

විශ්වවිද්‍යාලයේ එකිනෙක පීඨයන්හි එක් එක් අධ්‍යයන වර්ෂයන් තුල බඳවාගනු ලබන අනුමත ශිෂ්‍ය සංඛ්‍යාව හා තථ්‍ය ශිෂ්‍ය සංඛ්‍යාව අතර වෙනස්කම් නිරීක්ෂණය විය. 2013/2014 අධ්‍යයන වර්ෂය සම්බන්ධයෙන් ව්‍යාවහාරික විද්‍යාපීඨයේ අනුමත ශිෂ්‍ය සංඛ්‍යාව 200 ක් වුවත් සත්‍ය වශයෙන් බඳවාගත් ශිෂ්‍ය සංඛ්‍යාව 182 ක් විය. පශු සම්පත් ධීවර හා පෝෂණ විද්‍යාපීඨයේ අනුමත ශිෂ්‍ය සංඛ්‍යාව 170 ක් වුවත් බඳවාගත් ශිෂ්‍ය සංඛ්‍යාව 100 ක් විය. මේ අනුව ශිෂ්‍ය බඳවා ගැනීම නිසි ක්‍රමවේදයකට සිදු නොවීම හේතුවෙන් නියමිත සිසුන් සංඛ්‍යාව බඳවා ගැනීමට ඉහළ කළමනාකරණය විසින් පියවර ගෙන නොතිබුණි.

### 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2014 වර්ෂයේ ඉදිකිරීම් නිම කර භාරදී තිබූ ශිෂ්‍ය නේවාසිකාගාර 05 ක් වෙනුවෙන් 2015 වර්ෂයේදී ඇණවුම් කළ රු.10,728,976 ක් වටිනා Bunkbed හා උපකරණ ලබා නොගැනීම හේතුවෙන් එම නේවාසිකාගාර ශිෂ්‍ය පරිහරණය සඳහා සමාලෝචිත වර්ෂය අවසානයටත් ලබා දීමට නොහැකිවී තිබුණි.

(ආ) එක් එක් පාඨමාලාවේ ගාස්තු අයකරන ආකාරය පාඨමාලාවෙන් පාඨමාලාවට වෙනස් වන බැවින් හා එම ගාස්තු කොටස් වශයෙන් හා එක්වර අයකරන අවස්ථා පවතින බැවින් ඒවායේ අනන්‍යතාවය හඳුනාගත හැකි ආකාරයට පොත්පත් පවත්වාගෙන ගොස් නොතිබුණි.

(ඇ) විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය හා පශු සම්පත් ධීවර හා පෝෂණ විද්‍යා පීඨය සඳහා බාහිර කථිකාචාර්යවරුන් බඳවා ගැනීමේදී දේශන පැය, ක්ෂේත්‍ර පැය හා ප්‍රායෝගික පැය වෙන් වෙන් වශයෙන් සැලසුම් කර නොතිබුණු අතර, ගෙවීම් කිරීමේදී අනුමත දේශන හා ප්‍රායෝගික පැය ගණන සහ ඉටුකළ පැය ගණන අතර වෙනස්කම් නිරීක්ෂණය විය.

(ඈ) පශු සංවර්ධන වැඩසටහන් යටතේ මිලදී ගත් රු.1,647,590 ක් වටිනා ද්‍රව්‍ය විශ්වවිද්‍යාල තොග ලේඛනවල ඇතුළත් කර නොතිබුණි.

(ඉ) විශ්වවිද්‍යාලයේ ඉඩම් හිමිකාරීත්වය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) කුලියාපිටිය පරිශ්‍රයේ පිහිටි පිඹුරු අංක 992 හි කැබලි අංක 452 ද, වෙන්නප්පුව පරිශ්‍රයේ පිහිටි පිඹුරු අංක 4490 හි කැබලි අංක 1,2,7 ද මාකඳුර පරිශ්‍රයේ පිහිටි පිඹුරු අංක 10661 සඳහා ද පැවරුම් සහතික ලබා ගෙන නොතිබුණි.

(ii) මාකඳුර පරිශ්‍රයේ අක්කර 5 ක ඉඩම සඳහා රු. මිලියන 10 ක් පොල් පර්යේෂණ ආයතනයට ගෙවා තිබුණත්, ඒ සඳහා විකුණුම්කර ඔප්පුවක් ලබාගෙන නොතිබුණි.

(iii) විශ්වවිද්‍යාලය විසින් පිඹුරුපත් 06 ක් යටතේ කැබලි 09 ක් භුක්තියට ලබාගෙන තිබුණද, ඒ සඳහා ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබූ අතර, එම ඉඩම් කොටස්වල වටිනාකම වෙන් වෙන් වශයෙන් තක්සේරු කර ලබාගෙන නොතිබුණි.

## 4.3 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

පශු සම්පත් ධීවර හා පෝෂණ විද්‍යා පීඨයේ පශු සංවර්ධන වැඩසටහන යටතේ 2014 වර්ෂයේදී රු.2,484,494 ක් වැය කර ඉදිකළ ගොඩනැගිලි සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

## 4.4 කොන්ත්‍රාත් පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විශ්වවිද්‍යාලයේ ඉදිකිරීම් වෙනුවෙන් වූ කොන්ත්‍රාත් 05 ක් නිම කිරීම සඳහා මාස 09 සිට මාස 23 දක්වා ප්‍රමාදවී තිබුණද ඒ සඳහා ප්‍රමාද ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) කාර්ය මණ්ඩල හා ශිෂ්‍යයින් 500 කට එකවර පහසුකම් සැලසීම සඳහා ඉදිකිරීමට යෝජිත වූ ආපනශාලා ගොඩනැගිල්ල උපදේශක සමාගම විසින් වර්ග අඩි 8392 පරිමාණයට මුළු ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 45 කින් ඉදිකිරීමට (පිරිවැය සංශෝධනය නොකිරීමට යටත්ව) අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) මුළු ගොඩනැගිල්ල සඳහා 2012 දෙසැම්බර් 19 දින මූලිකව පිරිවැය රු.38,000,000 කට ඇස්තමේන්තුව පිළියෙල කර තිබියදී නැවත එය පළමු, දෙවන හා තෙවන ලෙස පිළිවෙලින් රු.20,000,000 ක්, රු.14,400,000 ක් හා රු.21,900,000 ක් එනම් එකතුව රු.56,300,000 කට අදියර 3 ක් යටතේ වෙන්කර ඇස්තමේන්තුගත මුදල වැඩිකර දක්වා තිබුණි.

(ii) ආයතනය විසින් උපදේශන සේවා සමාගමේ එකඟතාවය ඇතිව ගොඩනැගිල්ලේ පළමු අදියර සඳහා රු.20,000,000 කට පිරිවැය ඇස්තමේන්තුව පිළියෙල කර තිබියදී ප්‍රසම්පාදන ක්‍රියාවලිය සඳහා රු.34,000,000 කට සංශෝධනය කරන ලද ඇස්තමේන්තුවක් පදනම් කරගෙන තිබුණි.

(iii) මුළු ගොඩනැගිල්ල සඳහා වූ රු.38,000,000 ක මූලික පිරිවැය ඇස්තමේන්තුව කිසිදු හේතු දැක්වීමකින් තොරව පළමු අදියරේ පිරිවැය පමණක් රු.34,000,000 ක් ලෙස සංශෝධනය කිරීම නිසා මුළු ඇස්තමේන්තුගත පිරිවැය රු.70,300,000 ක් වීම හේතුවෙන් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාදී තිබුණු රු.45,000,000 ක වියදම් සීමාව රු.25,300,000 කින් ඉක්මවා තිබුණි.

(iv) මෙම පිරිවැය සංශෝධනයට අදාලව 2012 අගෝස්තු 07 දිනැති අංක 02/2012 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය පරිදි පිරිවැය ඇස්තමේන්තු පරීක්ෂණ කමිටුවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(v) මුළු ගොඩනැගිල්ල සඳහා රු.2,280,000 ක ගාස්තුවක් උපදේශන සේවා සැපයීමට අදාලව ගෙවීමට එකඟවී තිබුණද මෙසේ පිරිවැය සංශෝධනය නිසා එය රු.4,218,000 ක් දක්වා වැඩිකර තිබුණි.

(vi) තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් උපදේශන සමාගමේ උපදෙස් පරිදි අවම මිල ඉදිරිපත් කළ කොන්ත්‍රාත්කරු සමඟ සාකච්ඡා කර එකඟතාවයකට එළඹීමට කටයුතු

නොකර අවම මිල ප්‍රතික්ෂේප කර දෙවන අඩු මිල නිර්දේශ කර තිබීම නිසා රු.7,988,576 කින් කොන්ත්‍රාත්තුවේ වටිනාකම වැඩි වී තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

-----------------------------------------

### 5.1 ක්‍රියාකාරී සැලැස්ම

---------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 04 වගන්තිය ප්‍රකාරව දිගුකාලීන දැක්මක් සහිතව අදාල පනතේ සඳහන් අරමුණු සාක්ෂාත් කරගැනීම ඉලක්ක කරගත් ක්‍රියාකාරකම් ඇතුලත් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළයුතු වුවද, සමාලෝචිත වර්ෂය වෙනුවෙන් විගණනයට ඉදිරිපත් කළ සැලැස්ම චක්‍රලේඛය ප්‍රකාරව සකස් කර නොතිබුණි.

(ආ) ක්‍රියාකාරී සැලැස්ම අනුව සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබූ ඇස්තමේන්තුගත මුදල රු.3,500,000 ක් වූ ව්‍යාපෘති 03 කට ප්‍රතිපාදන නොලැබීම හේතුවෙන් ක්‍රියාත්මක කිරීමට නොහැකිවී තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුල ක්‍රියාත්මක කළ ව්‍යාපෘති 06ක ප්‍රතිපාදන ඉක්මවා රු.17,337,712 ක් වියදම් කර තිබූ අතර, එය සියයට 11 සිට සියයට 83 ක් දක්වා පරාසයක විය.

### 5.2 අයවැය ලේඛනමය පාලනය

--------------------------------

අයවැය ලේඛනයේ තිබුණු විෂයයන් 50 කට රු.71,913,000 ක අධි ඇස්තමේන්තු පිළියෙල කර තිබුණි. තවද වැය විෂයයන් 29 ක අදාළ අයවැය ගත ප්‍රතිපාදන ඉක්මවා රු.52,807,000 ක් වියදම් දරා තිබුණි. සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 02 ක රු. 850,000 ක් 2014 හා 2015 වර්ෂවලදී තොරතුරු තාක්ෂණ සංවර්ධන ව්‍යාපෘතිය සඳහා වූ රු.12,926,804 ක මුළු ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි. ඒ අනුව අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

### 5.3 වාර්ෂික වාර්තා සභාගත කිරීම

--------------------------------

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.3 ඡේදය ප්‍රකාරව අදාල වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුලත විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළයුතු වුවද, 2013 වර්ෂයේ වාර්තාව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් සභාගත කර නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර උපකුලපතිවරයාගේ අවධානයට යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුවේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | කොන්ත්‍රාත් පරිපාලනය | ප්‍රමාදවීම සඳහා ප්‍රමාද දඩ අය නොකර නිරන්තරයෙන් කාලය දීර්ඝ කිරීම් සිදුකර තිබුණි. |
| (ආ) | කාර්ය මණ්ඩල පරිපාලනය | අධ්‍යයන අංශයේ පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු නොකිරීම නිසා බාහිර දේශකයින්ගේ සහය ලබාගැනීම හේතුවෙන් විශාල පිරිවැයක් දැරීමට සිදුවී තිබුණි. |